# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1764/14 - 2012 ජුනි මස 27 වැනි බදාදා - 2012.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය

2012.03.20 වැනි දින පැවති බස්නාහිර පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ 2012.06.21 වැනි දින වැඩබලන ගරු ආණ්ඩුකාරතුමියගේ අනුඥාව ලද බස්නාහිර පළාත් සභාවේ 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය 2012.06.21 වැනි දින සිට ක්‍රියාත්මක වන බම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජගත් අංගගේ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන
හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා
සහ සභා කටයුතු අමාත්‍ය (බ. ප.).

2012ක් වූ ජුනි මස 22 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රයේ,
බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන හා කාන්තා කටයුතු,
පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**2012 අංක 03 දරන බස්නාහිර පළාත් සභාවේ මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය**

බස්නාහිර පළාතේ, මහජන සෞඛ්‍ය නගා සිටුවීම සහ සංරක්ෂණය කිරීම සඳහාත්, මදුරුවන් මගින් ඇති වන පීඩා සහ රෝග වැළැක්වීම සඳහාත්, අනෙකුත් මහජන සෞඛ්‍ය පීඩා මැඩ පැවැත්වීම සඳහාත්, ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහාත්, විධිවිධාන සැලසීම සඳහා වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1939 අංක 61 හා 1946 අංක 57න් සංශෝධිත 1882 අංක 15 දරන පීඩන ක්‍රියා ආඥාපනතට, හා 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැළැක්වීමේ පනතට අනනුකූල වේ. දීර්ඝ නාමය

මෙම ප්‍රඥප්තිය මගින් පළාත් පාලන ආයතනවලට නීතිය මගින් හිමි වී ඇති බලතල අහිමි කිරීමක් හෝ සීමා කිරීමක් සිදු නොවන්නේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට බලාත්මක වන්නේ ය. එම දිනය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

02. මෙම ප්‍රඥප්තිය යටතේ පහත සඳහන් ක්‍රියාවන් සිදු කිරීම වරදක් වන්නේ ය :

අපද්‍රව්‍ය ජලයට දැමීම

(අ) කවරෙකු විසින් වුවද, යම් කාණුවකට, අගලකට ජල පාරකට, වැවකට, ජලාශයකට, ළිඳකට, ජල භාජනයකට, ජල ප්‍රවාහයකට හෝ වාරි මාර්ගයකට, සතෙකුගේ මළකුණක් හෝ යම්කිසි කැත කුණු, කසල හෝ දුගඳ හමන යම් කිසි දෙයක් විසි කිරීම හෝ දැමීම හෝ පැමිණෙන්නට සැලැස්වීම, නැතහොත් යම්කිසි අපිරිසිදු හෝ දුගඳ හමන ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ තමා පදිංචිව සිටින ගෘහයෙන්, ගොඩනැගිල්ලෙන් හෝ භූමියෙන් ගලා යාමට හෝ සේදීයාමට හෝ ඇතුල්වීමට සැලැස්වීම හෝ ඉඩදීම, නැතහොත් එබඳු ජලය කවර ප්‍රමාණයකට නමුදු අපිරිසිදු වන පරිදි හෝ කිළිටි වන පරිදි යම් කිසිවක් කිරීම ;

මනුෂ්‍ය ආහාරයට නුසුදුසු දෑ විකිණීමට තබා තිබීම

(ආ) කවරෙකු විසින් වුවද, වෙළඳ පොළක, සාප්පුවක, ගොඩනැගිල්ලක, කඩ බක්කියක, මස්, කුකුළු ආදී පක්ෂීන්, මාළු, පළතුරු හෝ එළවළු වෙළඳාම පිණිස පාවිච්චි කරන ස්ථානයක, මනුෂ්‍ය ආහාරයට අයෝග්‍යවන සතෙකු, මළ කුණක්, මස්, මාළු, පළතුරු හෝ එළවළු තැබීම හෝ තැබීමට ඉඩ හැරීම නැතහොත් යම් ස්ථානයක හෝ මාර්ගයක එබන්දක් තැබීම හෝ තැබීමට ඉඩ හැරීම ;

හානිකර දෑ ආහාර ලෙස විකිණීම

(ඇ) කවරෙකු විසින් වුවද, යම්කිසි දෙයක් මනුෂ්‍ය ආහාරයක් හෝ පානයක් වශයෙන් පාවිච්චි කිරීමට නුසුදුසු තත්ත්වයක තිබේ යැයි හෝ නුසුදුසු තත්ත්වයක තිබේ යැයි දැන දැනම හෝ එසේ යැයි විශ්වාස කිරීමට කරුණු ඇතිව, එය මනුෂ්‍ය ආහාරයක් හෝ පානයක් සඳහා විකිණීමට හෝ ඉදිරිපත් කිරීම හෝ ප්‍රසිද්ධියේ තබා තිබීම ;

කාණු පාරට හෝ කාණුවලට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට විසි කිරීම

(ඈ) කවරෙකු විසින් වුවද පස් හෝ අපජලය හෝ කුණු හෝ අළු හෝ කසල හෝ බිඳුණු වීදුරු හෝ මැටි බඳුන් හෝ අන්කිසි රොඩු හෝ සෞඛ්‍යට බාධා වන පරිදි යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් යම් වීථියකට, පාරකට හෝ පොදු ස්ථානයකට, අතු පාරකට, කාණුවකට විසි කිරීම හෝ දැමීම නැතහොත් සිය මෙහෙකරුවන්ට එසේ කිරීමට ඉඩ හැරීම ;

වාහන සේදීම

(ඉ) කවර හෝ පුද්ගලයෙකු විසින් කිසියම් ප්‍රධාන මාර්ගයක, මාවතක, මංමාවතක, අඩි පාරක හෝ ප්‍රවේශ මාර්ගයක් අපවිත්‍ර වන ආකාරයට හෝ මහජන සෞඛ්‍යට පීඩාවන ආකාරයට ජල ස්ථම්භයකින් හෝ ළිඳකින් හෝ ඕනෑම ජල මූලාශ්‍රයකින් ජලය ප්‍රයෝජනයට ගෙන වාහන සේදීම ;

ප්‍රවේශ මාර්ගයක හෝ ප්‍රසිද්ධ ස්ථානවල සතුන්ට මළපහ කිරීම

(ඊ) කවරෙකු විසින් වුවද කිසියම් ප්‍රධාන මාර්ගයක, මංමාවතක, මාවතක, අඩි පාරක, ප්‍රවේශ මාර්ගයක හෝ ප්‍රසිද්ධ ස්ථානයක කිසියම් සතෙකුට හෝ සතුන්ට මළපහ කිරීමට යොමු කිරීමට සැලැස්වීම හෝ ඉඩ හැරීම ;

කසළ හෝ එවැනි යමක් තැබීම

(උ) පාරක, වීථියක හෝ ප්‍රසිද්ධ මංමාවතක නැතහොත් එබන්දක් අසල හෝ ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචි කරුවෙකු විසින් වුව ද නිසි භාජනයක් ඇතුළත හෝ හොඳින් ආවරණය කළ ස්ථානයක නොදමා, කිසියම් කසල ගොඩක්, සත්ව කොටස්, කුණු ගොඩක් නැතහොත් අන්කිසි අවැඩදායක හෝ දුගඳ හමන දෙයක් හෝ තැබීමට ඉඩ හැරීම, එබඳු භාජනයක් පිළිකුල් තත්ත්වයක හෝ දුගඳ හමන තත්ත්වයක තිබෙන්නට හැරීම හෝ එකී දේවල් ඉන් ඉවත් කොට එය ශුද්ධ කිරීමට හා පිරිසිදු කිරීමට අවශ්‍ය සුදුසු කටයුතු නොකොට පැහැර හැරීම ;

ස්ථානයක් අපවිත්‍ර ලෙස තැබීම

(ඌ) කුළියට දීය හැකි වූ හෝ දිය නොහැකි වූ ද, යම්කිසි පාරක, වීථියක හෝ ප්‍රසිද්ධ මංමාවතක නැතහොත් එබන්දක් අසල පිහිටියාවූ ද, යම්කිසි ගෙයක, ගොඩනැගිල්ලක හෝ, ඉඩමක අයිතිකාරයා හෝ එබඳු ස්ථානයක පදිංචිව සිටින්නාවූ හෝ කවරෙකු විසින් වුවද, යම් කිසිවෙකුට සෞඛ්‍ය පීඩාවක් වන පරිද්දෙන් හෝ යම්කිසි තැනැත්තෙකුගේ සෞඛ්‍යයට හානි වන පරිද්දෙන් අපවිත්‍ර ලෙස හෝ සෞඛ්‍යයට තර්ජනයක් වන ලෙස එකී ස්ථානය තැබීම, නැතහොත් තැබීමට ඉඩහැරීම හෝ එය මහජන සෞඛ්‍යයට තර්ජනයක් වන ලෙස පැලැටි වලින් ගහන වීමට ඉඩ හැරීම ;

(එ) කවරෙකු විසින් වුවද, තමා පදිංචිව සිටින හෝ තමාට අයත් ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් තුළ හෝ මතුපිට මහජන සෞඛ්‍යයට අහිතකර වන අගලක් හෝ පීල්ලක් හෝ කාණුවක් හෝ වැසිකිළි වලක් හෝ අන්කිසි එබඳු භාජනයක් හෝ ස්ථානයක් තබා ගැනීම ;

පිළිකුල් වූ දුගඳ හමන කාණු

(ඒ) කවරෙකු විසින් වුවද, තමා පදිංචිව සිටින ගෙයක, ගොඩනැගිල්ලක හෝ තමාට අයත් ඉඩමක හරකුන්, එළුවන්, ඌරන්, කුකුළන්, තාරාවුන්, කළුකුම් හෝ වෙනත් පක්ෂීන් නීතිරීති, අණපනත් ප්‍රඥප්ති හෝ රෙගුලාසි මගින් පනවා ඇති විධිමත් ප්‍රමිතීන් ගෙන් බැහැරව ජනතාවට පීඩාවක් වන පරිද්දෙන් හෝ යම් තැනැත්තෙකුගේ සෞඛ්‍යට හානි කරන පරිද්දෙන් තබා ගැනීම ;

හරකුන්, එළුවන්, ඌරන් ආදී සතුන් තබා ගැනීම

(ඔ) ගෙයක, ගොඩනැගිල්ලක හෝ තාප්පයක අයිතිකරුවන කවර තැනැත්තෙකු විසින් වුවද, එය ගරා වැටුණු තත්ත්වයක තිබෙන්නට ඉඩ හැරීම, නැතහොත් එම ගෙයි හෝ ගොඩනැගිල්ලේ පදිංචිකාරයින්ට හෝ අසල්වාසී ගෙවල්වලට හෝ ගොඩනැගිලිවලට හෝ ඒවායේ පදිංචිකාරයින්ට හෝ මගීන්ට හෝ අනතුරුදායක තත්ත්වයක එය තිබෙන්නට ඉඩ හැරීම ;

ගෙය ආදිය ගරා වැටුණු තත්ත්වයකට හෝ වැටෙන තත්ත්වයකට තිබෙන්නට හැරීම

(ඕ) කවරෙකු විසින් වුවද තමා පදිංචිව සිටින ස්ථානයක ඇතුළත යම් තැනක අපතේ යන හෝ පල් වී තිබෙන ජලය තිබෙන්නට හැරීම හෝ වැසිකිළියක හෝ වැසිකිළි වළක තිබෙන දේ පිටතට ගලා යාමට හෝ ඉන් පිටතට කාන්දු වීමට හෝ ඉඩ හැරීම ;

අපතේ යන හෝ පල් වී තිබෙන ජලය එසේ තිබෙන්නට ඉඩ හැරීම

(ක) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසිම ස්ථානයක්, නියමිත අධිකාරියකින් ලබා ගන්නා ලද බලපත්‍රයක් යටතේ වුවද එම බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝණය කරමින් හෝ මහජන සෞඛ්‍යට පීඩාවක් හෝ පීඩා ඇතිවන ආකාරයට යම් කාර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් සඳහා පාවිච්චි කිරීම ;

මහජන සෞඛ්‍යයට පීඩාවක් වන පරිදි කර්මාන්ත ශාලාවක් තබා ගැනීම

(ග) කවරෙකු විසින් වුවද, යම් කිසිවෙකුට පීඩා වන පරිද්දෙන් හෝ යම් කිසිවෙකුගේ සෞඛ්‍යයට බාධා වන පරිද්දෙන් යම් ස්ථානයක යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ද්‍රවයක් තැබීම හෝ දමා තිබීම ;

සෞඛ්‍යයට බාධා වන පරිදි අපද්‍රව්‍ය තබා ගැනීම

(ච) කවරෙකු විසින් වුවද කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ මහජනයා ගැවසෙන විවෘත ස්ථානයක හෝ ශබ්ද වාහිනී යන්ත්‍ර මාර්ගයෙන් හෝ රූපවාහිණී යන්ත්‍ර හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් මාර්ගයෙන් හෝ මහජනතාවට පීඩා වන අන්දමට අධික ශබ්දයකින් යුතුව විකාශණයන්, ප්‍රචාරණයන් හෝ විසුරුවා හැරීම සිදු කිරීම ;

ගුවන් විදුලි යන්ත්‍ර හා වෙනත් මාධ්‍යයන් මගින් පීඩා ඇති කිරීම

(ජ) කවරෙකු විසින් වුවද, කිසියම් පෞද්ගලික වාසස්ථානයක් තුළ එකී පරිශ්‍රයෙහි ඇසල්වැසි නේවාසික ස්ථානවලට පීඩාවක් වන පරිද්දෙන් අධික ශබ්දයෙන් යුත් ශබ්දවාහිණී යන්ත්‍ර, ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිණී යන්ත්‍ර හෝ තැටි ධාවන යන්ත්‍ර හෝ එබඳු ඕනෑම ආකාරයක යන්ත්‍රයක් මගින් ශබ්ද විකාශණ හෝ ප්‍රචාරය කිරීම හෝ විසුරුවා හැරීම ;

ශබ්ද මගින් ඇති වන පීඩාව

(ට) මහජන සෞඛ්‍යට හානියක් වන පරිදි කවර හෝ පුද්ගලයෙකු විසින් කිසියම් පරිශ්‍රයක, නිවසක හෝ වෙළඳ ස්ථානයක, නේවාසිකාගාරයක හෝ භෝජනාගාරයක හෝ නේවාසික ස්ථානවලට, පාසැල් වලට, රෝහල්වලට හෝ වෙනත් මහජනතාව පදිංචි ස්ථානයන්ට හෝ මහජනතාව ගැවසෙන ස්ථානයන්ට හෝ පීඩා හට ගන්නා අන්දමට ශබ්දය ජනිත වන අන්දමින් ව්‍යාපාර කටයුතු වල නිරත වීම, ආහාර නිෂ්පාදනය කිරීම, කාර්මික කටයුතුවල නිරතවීම, කම්හල වැඩ කිරීම, කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම හෝ වෙනත් ඕනෑම පීඩාකාරී ශබ්ද ඇතිවන අයුරින් කටයුතු කිරීම ;

ශබ්දය ජනිතවන අන්දමින් ව්‍යාපාර කටයුතු වල නිරතවීම

ඉහත (ච), (ජ) හා (ට) යන අනු වගන්ති සඳහා අදාල ශබ්ද මට්ටම තීරණය කිරීමේදී 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා ඊට පසු කාලීනව සිදු කරන ලද සංශෝධන යටතේ වන ශබ්ද සීමා අදාල කරගත යුතු ය ;

(ඩ) කවර හෝ පුද්ගලයකු විසින් ප්‍රධාන මාර්ගයක්, මාවතක්, මංමාවතක්, අඩි පාරක්, පදික වේදිකාවක් හෝ මාර්ගය ආශ්‍රිතව පවත්නා කාණුවක් හෝ අවහිරවන අන්දමින් අනවසර ඉදිකිරීමක් සිදු කිරීම, මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය, අබලි ද්‍රව්‍ය, හෝ දැව කඳන් හෝ ඉරූ දැව හෝ ලී හෝ කුමන ආකාරයක ද්‍රව්‍යයක් හෝ ගබඩා කිරීම, තැන්පත් කිරීම හෝ දැමීම

කාණු හා මාර්ග අවහිර කිරීම

අප ජලය හා වැසිකිලි ජලය ගලා යාමට සැලැස්වීම

(ත) කවරෙකු විසින් වුවද කිසියම් ප්‍රධාන මාර්ගයකට, මාවතකට, මංමාවතකට, අඩි පාරකට, ප්‍රවේශ මාර්ගයකට හෝ එකී මාර්ගයක කාණුවකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට යාබද ඉඩමකට කිසියම් පෞද්ගලික හෝ පොදු පරිශ්‍රයකින් බැහැර කරනු ලබන අප ජලය හෝ වැසිකිළි හා/හෝ කැසිකිළි අපද්‍රව්‍ය දැමීම හෝ ගලා යාමට සැලැස්වීම ;

(ද) ස්වභාවික ජලය බැස යාමට ඇති ජල මාර්ග ඔස්සේ එම ජලය ගලා යාමට බාධක ඇති කිරීම

2 වගන්තිය යටතේ දක්වා ඇති ඇතැම් වැරදි වලට දඬ නියම කල හැකි බව

3. (1) ඉහත සඳහන් 2 වගන්තියේ අ, ආ, ඇ, ඈ, ඉ, ඊ, උ වගන්තිවල දක්වා ඇති වැරදි වලින් යම් කිසිවක් කරන්නා වූ කවරෙකු වුව ද, මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය ;

(2) ඉහත I උප වගන්තියට අනුව යම් වරදකට වරදකරු වන යම් තැනැත්තෙකු මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන්දහසකට නොඅඩු රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට නියෝග කළ හැකිය ;

(3) ඉහත 3(2) වැනි උප වගන්තිය යටතේ දඩයක් ලෙස පනවන ලද මුදල මහේස්ත්‍රාත්වරයා විසින් පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමට අදාලව ඇතැම් පියවර ගන්නා ලෙස නියම කළ හැකි බව

4 (1) ඉහත 2 වගන්තියේ ඌ, එ, ඒ, ඔ, ඕ, ක, ග, ච, ජ, ට, ඩ, ත, ද යටතේ සඳහන් විධිවිධාන අනුව යම් පරිශ්‍රයක හෝ එහි තබා ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් දෙයක් මහජන සෞඛ්‍යට අහිතකර බවට නිසි බලධාරියාට හෝ බලයලත් නිලධාරියාට පෙනී යන අවස්ථාවක නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා විසින් ලිඛිතව දැන්වීමක් මගින් පහත දැක්වෙන පියවරවල් වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් එම ලිඛිත දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ අනුගමනය කරන ලෙස හෝ නිසි පියවර ගන්නා ලෙස එම පරිශ්‍රයේ අයිතිකරුට පදිංචිකරුට හෝ භාරකරුට නියම කරනු ලැබිය හැක.

(අ) යම්කිසි වීථියක, මාවතක හෝ ප්‍රසිද්ධ පාරක නැතහොත් එබන්දක් අසල පිහිටියා වූ ද, යම්කිසි ගෙයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක යම් තැනැත්තෙකුගේ සෞඛ්‍යට හානි කර නොවන පරිද්දෙන් එකී ස්ථානය පවිත්‍රව පවත්වා ගැනීමට.

(ආ) මහජන සෞඛ්‍යයට අහිතකර දුගඳ හමන අගලක්, පිලක්, කාණුවක්, වලක්, වැසිකිළි වලක් හෝ අන්කිසි එබඳු හෝ භාජනයක් එම ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ මහජන පීඩාවක් නොවන ලෙස සකස් කිරීමට.

(ඇ) මහජන සෞඛ්‍යයට අහිතිකර නොවන ආකාරයට හරකුන්, එළුවන්, ඌරන්, තාරාවන්, කළුකුම් හෝ වෙනත් පක්ෂීන් ඇති කරන ලෙසට.

(ඈ) ගරා වැටුනු ගෙයක්, ගොඩනැගිල්ලක් හෝ තාප්පයක්, පදිංචිකරුවන්ට හෝ අසල්වැසියන්ට අනතුරුදායක නොවන සේ සකස් කිරීමට හෝ ඉවත් කිරීමට,

(ඉ) යම් විථියක්, මාවතක්, පාරක් හෝ ප්‍රසිද්ධ කාණුවක් මත එම වීථිය, මාවත, පාර, කාණුව අවහිර වන පරිදි කිසියම් වැටක්. තාප්පයක්, කොන්ක්‍රිට් හෝ යකඩ ආවරණයක්, කඩ බක්කියක්, ඉවත් කරන ලෙසට හෝ ඉදි නොකරන ලෙසට,

(ඊ) යම් ස්ථානයක පදිංචි වී සිටින කවරෙක් වුව ද එම ස්ථානය ඇතුළත යම් තැනක, අපතේ යන හෝ පල්වී තිබෙන ජලය තිබෙන්නට ඉඩ හැරීම හෝ වැසිකිලියක හෝ වැසිකිල වලක තිබෙන දේ පිටතට ගලා නොයන ලෙසට හෝ කාන්දුවීම නවතා දමන ලෙසට,

(උ) යම් කාර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරික ස්ථානයක් මහජන පීඩාවක් නොවන ලෙස පවත්වාගෙන යාමට සුදුසු පියවර ගැනීමට,

(ඌ) යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක්, හෝ ද්‍රවයක් මහජන පීඩාවක් හෝ මහජන සෞඛ්‍යයට බාධා නොවන අයුරින් තබා ගැනීමට,

(එ) මහජනයා ගැවෙසෙන විවෘත ස්ථානයක හෝ ව්‍යාපාරික ස්ථානයක ශබ්ද වාහිනී යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, හෝ වෙනත් ඕනෑම විද්‍යුත් මාධ්‍යයක් මාර්ගයෙන් මහජනතාවට පීඩා වන ආකාරයට, අධික ශබ්දයෙන් යුතුව කරනු ලබන, විකාශනයන්, ප්‍රචාරණයක් හෝ විසුරුවා හැරීම් නවතා දමන ලෙසට,

(ඒ) කිසියම් පෞද්ගලික වාසස්ථානයක් තුළ එකී පරිශ්‍රයෙහි අසල්වැසි නේවාසික ස්ථානවලට පීඩාවක් වන පරිද්දෙන් අධික ශබ්දයෙන් යුත් ශබ්දවාහිනී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිණී යන්ත්‍ර හෝ තැටි ධාවන යන්ත්‍ර, එබඳු ඕනෑම යන්ත්‍රයක් මගින් ශබ්ද විකාශනය හෝ ප්‍රචාරණය නොකිරීමට හෝ විසුරුවා හැරීම නතර කරන ලෙසට,

(ඔ) නේවාසික ස්ථාන, පාසැල්, රෝහල් හෝ වෙනත් මහජනතාව පදිංචි ස්ථානයන්ට හෝ ගැවසෙන ස්ථානයන්ට හෝ පීඩා හට ගන්නා අන්දමට ශබ්දය ජනිත වන අන්දමින් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන ලෙසට, ආහාර නිශ්පාදනය නොකරන ලෙසට, කාර්මික කටයුතුවල නිරත නොවන ලෙසට, කම්මල් වැඩ නොකරන ලෙසට හෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන නොයන ලෙසට හෝ වෙනත් ඕනෑම පීඩාකාරී ශබ්දයක් ඇති වන ආකාරයෙන් කටයුතු නොකරන ලෙසට,

(ඕ) ප්‍රධාන මාර්ගයකට, මාවතකට, අඩිපාරකට, පදික වේදිකාවකට හෝ මාර්ගය ආශ්‍රිතව පවත්නා කාණුවක් අවහිර වන ආකාරයෙන් යම් අනවසර ඉදිකිරීමක් ඉවත් කරන ලෙසට හෝ ගොඩනැගිලි ද්‍රව්‍ය, අබලි ද්‍රව්‍ය, දැව කඳන්, ඉරූ දැව හෝ ලී හෝ කුමන ආකාරයක ද්‍රව්‍යයක් හෝ ගබඩා නොකිරීමට හෝ තැන්පත් නොකිරීමට හෝ නොදැමීමට හෝ මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා නොකරන ලෙසට,

(ක) කිසියම් ප්‍රධාන මාර්ගයකට, මාවතකට, අඩි පාරකට, ප්‍රවේශ මාර්ගයකට හෝ එකී මාර්ගයේ කාණුවකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට හෝ යාබද ඉඩමකට කිසියම් පෞද්ගලික හෝ පොදු පරිශ්‍රයකින් බැහැර කරනු ලබන අප ජලය හෝ වැසිකිලි හෝ කැසිකිළි අපද්‍රව්‍ය නොදමන ලෙසට හෝ ගලා යාමට නොසැලැස්වීමට,

(ග) ස්වාභාවික ජලය බැස යාමට ඇති ජල මාර්ග ඔස්සේ එම ජලය ගලා යාමට බාධක ඇති නොකිරීමට හෝ බාධා ඉවත් කිරීමට.

(2) මෙම ප්‍රඥප්තියේ ඉහත සඳහන් 4 වගන්තියේ I වැනි උපවගන්තිය ප්‍රකාරව යම් පීඩාවක් හෝ මහජන සෞඛ්‍යයට හානිකර යම් දෙයක් නොකර සිටීමට හෝ ඉවත් කරන ලෙසට හෝ නවතා දමන ලෙසට කරනු ලබන නියමයන් උල්ලංඝණය කරන හෝ ඊට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය. 4(1) උපවගන්තිය යටතේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා නොකිරීම වරදක් බව

(3) ඉහත 2 උපවගන්තිය අනුව යම් වරදකට වරදකරු වන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තියේ 8 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දඬුවමකට යටත් වන්නේ ය.

5. මදුරුවන්ගෙන් බෝවන සියලුම රෝග වැලැක්වීම සහ තුරන් කිරීම සහතික කිරීමේ කාර්යය සහ මදුරුවන් බෝ වන ස්ථාන විනාශ කිරීම සහ තුරන් කිරීමේ කාර්යයන් සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග ගැනීම, සෑම පරිශ්‍රයකම අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හා/හෝ භාරකරුවෙකු විසින් කළ යුතු ය. මදුරුවන්ගෙන් බෝවන රෝග හා පීඩා වැළැක්වීමේ ක්‍රියා මාර්ග

(1) යම් පරිශ්‍රයක හෝ එය ඇතුළත ඇති ජලය රැඳී තිබිය හැකි විවෘත ටින්, බෝතල්, පෙට්ටි, පොල් කටු, පොල් කෝම්බ, ටයර් හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ භාජනයක් ඉවත් කිරීමට, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් ජලය නොරැඳෙන ලෙස හා ප්‍රයෝජනවත් ආරක්ෂාකාරී ලෙස බැහැර කිරීම,

(2) වැහි පීලි, පීලි, ජලය බැස යන පයිප්ප හෝ කාණු වලින් හෝ ජලය මනා ලෙස ගලා යන පරිදි සියලු බාධක ඉවත් කිරීම.

(3) මදුරුවන් බෝවීම වලක්වන පරිදි ජල භාජන, වතුර ටැංකි, ශීතකරණ, වායු සමීකරණ යන්ත්‍ර හෝ ජලය රඳවා ගැනීමේ හෝ රැදෙන වෙනත් භාජන වසා සහ ආවරණය කොට, යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම.

(4) පරිශ්‍රයෙහි පිහිටා ඇති යම් ළිඳක් සහ එහි අවට යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යමින් එය මදුරුවන් හෝ නොවන ආකාරයෙන් පවත්වාගෙන යාම සහ එමගින් මදුරුවන් බෝවීම වැළැක්වීම.

(5) යම් පරිශ්‍රයක ඇති යම් කෘතිම පොකුණක් ජලාශයක් හෝ තටාකයක් මදුරුවන් බෝ නොවන ආකාරයෙන් තබා ගැනීම.

(6) නේවාසික ස්ථානයක් වාශයෙන් භාවිතා කරනු ලබන යම් පරිශ්‍රයක් තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඇතුළත හෝ පිටත පිහිටි මදුරුවන් බෝවන ආකාරයෙන් ජලය රැඳීමට තුඩුදෙන ශාක වර්ග, පැළැටි හා පඳුරු ඉවත් කිරීම හෝ එම අවධානම නිසි පරිදි ඉවත් කිරීම.

(7) පරිශ්‍රය තුළ හෝ ඇතුළත මදුරුවන් බෝවීමට හිතකර වෙනත් යම් පසුබිමක් ඉවත් කිරීම හෝ වැළැක්වීම.

(8) ඉදිකිරීම සිදු කරමින් පවතින පරිශ්‍ර තුළ එම කටයුතු අවසන් වනතුරු එම පරිශ්‍ර මදුරුවන් බෝ නොවන අකාරයෙන් පවත්වාගෙන යාම සහ පියස්ස කොන්ක්‍රීට් තට්ටු සහිත ගොඩනැගිලි වල එම පියස්ස මත කිසිම අයුරකින් ජලය නොරැඳෙන ආකාරයෙන් පවත්වාගෙන යාම.

(9) යම් පරිශ්‍රයක දිය උරන වලවල්, පූතික වලවල් හෝ ටැංකි තුළ, බෝවිය හැකි මදුරුවන් පිටතට පැමිණිය නොහැකි ආකාරයට එම වලවල් හෝ ටැංකි මුද්‍රා තබා කුහර රහිතව පවත්වාගෙන යාම හෝ එම වලවල්වල ඒකරාශී වී ඇති අහිතකර වායුව පිටවීම සඳහා වලවල් ආවරණයවනසේ සවිකර ඇති කොන්ක්‍රීට් පියැසි මත යකඩ හෝ පී. වී. සී. බට සවි කිරීම වැළැක්වීම.

*මදුරු කීටයන් ඇති බව පෙනී යන අවස්ථාවක ස්ථානීය දඩ නියම කළ හැකි බව*

6 (1) ඉහත සඳහන් 5 වැනි වගන්තියේ I වැනි උපවගන්තියේ සඳහන් යම් පරිශ්‍රයක එය ඇතුළත ජලය රැඳී තිබිය හැකි විවෘත ටින්, බෝතල්, පෙට්ටි, පොල්කටු, පොල් කෝම්බ හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ භාණ්ඩයක මදුරු කීටයන් බෝ වී ඇති බව නිසි බලධරයාට හෝ බලයලත් නිලධාරියාට පෙනී යන අවස්ථාවක එම වරද සිදුවන ස්ථානයේ අයිතිකරු, පදිංචිකරු හෝ භාරකරු එම වරද පිළිගන්නා අවස්ථාවක ඔහුගේ කැමැත්ත මත මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියට පමුණුවා චෝදනා ඉදිරිපත් කිරීම වෙනුවට වෙනත් යම් රජයේ නිලධාරයෙකු ඉදිරිපිට බලයලත් නිලධාරියා විසින් රුපියල් පන්සීයයකට නොඅඩු රුපියල් තුන්දාහකට නොවැඩි ස්ථානීය දඩයක් නියම කල හැකිය. මදුරු කීටයන් සහිත හෝ නොවන ජලය පිරී ඇති භාජන හෝ භාණ්ඩ නිසි බලධාරියා හෝ බලයලත් නිලධාරියා ඉදිරිපිට සුදුසු පරිදි ඉවත් කිරීම හෝ විනාශ කිරීම එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ භාරකරු හෝ විසින් කළ යුතු ය.

*ස්ථානීය දඩ ගෙවීම අතපසු කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය හැකි බව.*

(2) 6(1) හි සඳහන් ස්ථානීය දඩ මුදල බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලදුපතක් ලබා ගත යුතු අතර එම ලදුපත දින 10ක් ඇතුළත එම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අතපසු කරන්නේනම් ඔහුට විරුද්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ චෝදනා ගොනුකර නඩු පැවරීම නීත්‍යානුකුල වන්නේ ය.

(3) 6(1) හි සඳහන් ස්ථානීය දඩ මුදල බස්නාහිර පළාත් සභා පොදු අරමුදලට බැර කළ යුතු ය.

(4) ඉහත සඳහන් 5 වැනි වගන්තියේ I වැනි උපවගන්තියේ සඳහන් නියමයන් කඩකිරීම පිළිනොගන්නා සහ 5 වැනි වගන්තියේ 2, 3, 4, 5, 6, 7, 8 යන වගන්තිවලින් දක්වා ඇති ස්ථාන වල මදුරු කීටයන් බෝවීමට ඉඩ හැර ඇති, බෝ වී ඇති සියලුම පරිශ්‍රවල අයිතිකරු, පදිංචිකරු හෝ භාරකරු එම ප්‍රදේශයේ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර චෝදනා ගොනුකොට මෙම ප්‍රඥප්තියේ 8 වැනි වගන්තිය ප්‍රකාරව දඬුවම් නියම කිරීම නීත්‍යානුකුලව වන්නේ ය.

*ඇතැම් පියවර ගන්නා ලෙස අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකි බව.*

7. ඉහත සඳහන් 5 වගන්තියේ සඳහන් විධිවිධාන අනුව යම් පරිශ්‍රයක හෝ එහි තබා ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් දෙයක් මදුරුවන් බෝවීමට හිතකර වී ඇති බවට නිසි බලධරයාට හෝ බලයලත් නිලධාරියාට පෙනී යන අවස්ථාවක, නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා විසින් ලිඛිත දැන්වීමක් මගින් පහත දැක්වෙන පියවරවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් එම ලිඛිත දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ අනුගමනය කරන ලෙස හෝ නිසි පියවර ගන්නා ලෙස එම පරිශ්‍රයේ අයිතිකරුට, පදිංචිකරුට හෝ භාරකරුවෙකුට නියම කරනු ලැබිය හැකි ය.

(1) යම් පරිශ්‍රයක් තුළ හෝ එහි ඇති යම් ගොඩනැගිල්ලක ඇති මදුරුවන් බෝවීමට හිතකර ආකාරයට ජලය පිරී ඇති වැහිපීලි, පීලි හෝ පයිප්ප හෝ කාණු ජලය මනා ලෙස ගලා යන පරිදි අලුත්වැඩියා කිරීමට,

(2) යම් පරිශ්‍රයක ඇති ජල භාජන හෝ වර්ෂා ජලය රැස්කිරීම සඳහා වූ ටැංකි, වතුර ටැංකි, ශීතකරණ, වායුසමීකරණ යන්ත්‍ර හෝ ජලය රඳවා ගැනීමේ වෙනත් භාජන වසා සහ ආවරණය කොට යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාමට එහි වූ ජලය කලින් කල ඉවත් කළ හැකි වන පරිදි ඉදිකිරීමට හෝ අලුත්වැඩියා කිරීමට,

(3) යම් පරිශ්‍රයක ඇති වර්ෂා ජලය රැස්කිරීම සඳහා වූ ටැංකියකින්, වතුර ටැංකියකින් හෝ කෘත්‍රිම පොකුණකින් හෝ ජලාශයකින් ජලය ඉවත් කොට ඒවා පිරිසිදු කිරීම සහ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒවා තවදුරටත් භාවිතා නොකරනු ලබන විට ඒවා වසා දැමීමට,

(4) මදුරුවන් බෝවීම වළක්වන ආකාරයට පරිශ්‍රයක ඇති යම් ළිඳක් පවත්වාගෙන යාමට,

(5) ජලය එකතුවීමට සහ පල්වීමට ඉඩ ඇති යම් කැණීමකින් හටගත් වලක්, භාවිතා නොකරන ළිඳක්, වැසිකිලි වලක් පොකුණක් හෝ වෙනත් යම් ස්ථානයක් පිරවීම, එහි ජලය ඉවත් කිරීම හෝ ඊට සුදුසු පියවර ගැනීමට,

(6) යම් පරිශ්‍රයක ඇති වගුරු බිම්, දිය කඩිති සහ ජලය එකතුවන ස්ථානවලින් ජලය ඉවත් කිරීම හෝ ජෛව විද්‍යාත්මක ක්‍රම මගින් අවදානම ඉවත් කිරීමට,

(7) මදුරුවන් බෝවීමට පහසුකම් සලසන බවට සොයා ගනු ලැබ ඇති ජලජ ශාක හෝ ජලය රැඳිය හැකි හෝ යම් ගොටු සහිත ශාකයක් හෝ ශාක ඉවත් කිරීමට, උදුරා දැමීමට සහ විනාශ කිරීමට,

(8) ඉදිකිරීමක් පවත්වාගෙන යන පරිශ්‍රයක හෝ කොන්ක්‍රීට් තට්ටුව සහිත ගොඩනැගිලිවල මදුරුවන් බෝවන ආකාරයට ජලය රැඳී තිබීමට නොහැකි වන අයුරින් පවත්වාගෙන යාමට,

(9) යම් පරිශ්‍රයක දිය උරන වලවල්, පූතික වලවල් හෝ ටැංකි තුළ බෝවිය හැකි මදුරුවන් පිටතට පැමිණිය නොහැකි ආකාරයට එම වලවල් හෝ ටැංකි මුද්‍රා තබා කුහර රහිතව පවත්වාගෙන යාමට හෝ එම වලවල් ආවරණය වන සේ සවිකර ඇති කොන්ක්‍රීට් පියැසි මත යකඩ හෝ පී. වී. සී. බට සවි කිරීම වැළැක්වීමට,

(10) නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් යම් පියවරයන් ගැනීමට,

*4, 5 හා 7 වැනි වගන්ති මගින් පනවා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා නොකිරීම වරදක් බව.*

8. (1) මේ ප්‍රඥප්තියේ 2 වගන්තිය යටතේ දක්වා ඇති වැරදි සිදු කිරීම හෝ 5 වැනි වගන්තිය මඟින් පනවා ඇති යම් නියමයක් හෝ නියමයන් හෝ 4 හා/හෝ 7 වැනි වගන්තිය අනුව කරන ලද විධානයක් හෝ පවරන ලද යම් කාර්යයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ 6 වැනි වගන්තියේ 4 වැනි උපවගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

(2) ඉහත (1) උපවගන්තියට අනුව යම් වරදකට වරදකරුවෙකු වන යම් තැනැත්තෙකු මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට පහත සඳහන් ආකාරයේ දඬුවමකට යටත් වන්නේ ය -

(අ) එම වරද ප්‍රථමවරට කරන ලද වරදක් නම් රුපියල් තුන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස 06කට නොවැඩි සිර දඬුවමකට හෝ ඉහත දණ්ඩන දෙකටම හෝ යටත් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට නියෝග කළ හැකිය.

(ආ) එම වරද දෙවනවරට හෝ ඊට පසුව කරන ලද වරදක් නම් රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් පනස්දහසකට නොවැඩි මාස 06කට නොවැඩි සිර දඬුවමකට හෝ ඉහත දණ්ඩන දෙකටම හෝ යටත් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට නියෝග කළ හැකිය.

(3) ඉහත (1) උපවගන්තිය යටතේ වරදක් කළ සෑම කෙනෙකුටම (2) උපවගන්තියේ සඳහන් දණ්ඩන වලට අමතරව බලයලත් නිලධාරියෙකු විසින් වරද අනාවරණය කරගත් දින සිට ලබා දුන් නිවේදනයේ සඳහන් නිශ්චිත දින ගණනට පසුව ද වරද සිදු කරන්නේ නම් එම වරද සිදු කරන එක් එක් දිනය සඳහා රුපියල් දෙසීය බැගින් වූ අතිරේක දඩයකට ද ඔහු යටත් වන්නේ ය.

(4) 8. (2) වැනි උපවගන්තියේ සඳහන් දඩ මුදල පැනවීමට අමතරව මෙම ප්‍රඥප්තියේ 7 වැනි වගන්තිය යටතේ පවරා ඇති කාර්යයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මත වරදකරුවෙකු කරනු ලැබූ විටක දී එම කාර්යයන්ට අනුකූලව ක්‍රියා කරමින් මහජන සෞඛ්‍යයට අහිතකර ක්‍රියා වැළැක්වීම සඳහා නිසි බලධාරියා විසින් දැනුම් දී ඇති නියමයන්ට අනුකූලව ක්‍රියා කරන ලෙසට එම පරිශ්‍රයේ අයිතිකරුට, පදිංචිකරුට හෝ භාරකරුට මහෙස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැකි ය.

නිසි බලධරයා විසින් වැඩ සිදු කළ යුතු බව හෝ පියවර ගත යුතු බව.

9. මේ ප්‍රඥප්තියේ 4 හා 7 වැනි වගන්ති යටතේ ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති යම් පරිශ්‍රයක අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හෝ යම් තැනැත්තෙකු හෝ විසින් එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත එහි නිශ්චිතව දැක්වෙන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එසේ ක්‍රියා නොකරන අවස්ථාවක හෝ අයිතිකරුවෙකු, භාරකරුවෙකු නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වන හෝ අපහසු වන අවස්ථාවක වහාම මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කළ යුතු යැයි නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලයලත් නිලධාරියා හෝ තීරණය කරන අවස්ථාවක පහත පියවර ගත යුතු ය :—

(1) නිසි බලධරයා විසින් තීරණය කර ඇති කාර්යයන් නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලයලත් නිලධාරියාගේ අධීක්ෂණය යටතේ එකී මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කිරීම ;

(2) එකී මහජන සෞඛ්‍ය පීඩාව ඉවත් කිරීමේ දී හෝ අවශ්‍ය පියවර ගැනීමේ දී දරන ලද වියදම වශයෙන් වැය වූ මුදල එකී පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ භාරකරු හෝ තමා යැයි අයිතිවාසිකම් පාන අදාළ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර එම මුදල සඳහන් කර ලබා දෙන වවුචරයකට අනුව එකී මුදල වැඩ කරන දින 03ක් තුළ නිසි බලධාරියා වෙත ගෙවිය යුතු ය. එසේ ගෙවා ලබා ගත් ලදුපත එම පරිශ්‍රය පිහිටි ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට භාර දිය යුතු ය ;

(3) එකී මුදල නියමිත කාලය තුළ නිසි ලෙස ගෙවා නොමැති අවස්ථාවක එකී තැනැත්තාට හෝ අයිතිකරුට හෝ පදිංචිකරුට එරෙහිව අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම කළ හැකිය ;

9 වැනි වගන්තිය යටතේ පිරිවැය වශයෙන් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම.

(4) 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ මුදල ගෙවීම පැහැර හරින අවස්ථාවල දී එම කටයුතු ඉටු කිරීමේ දී හෝ පියවර ගැනීමේ දී දරන ලද වියදම් වශයෙන් අයවිය යුතු මුදල පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් නිසි බලධාරියා විසින් හෝ බලයලත් නිලධාරියා විසින් එම වරද සිදු කළ ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එම මුදල අයකර ගැනීම සඳහා ලඝු නඩු විභාගයකින් පසු එම සහතිකයේ සඳහන් මුදල ගෙවන ලෙසට මහෙස්ත්‍රාත්වරයාට නියෝග කළ හැකිය ;

(5) ඉහත (3) වගන්තියට අදාළ නීති කෘත්‍යයක දී අදාළ තැනැත්තා 8(2) වගන්තියට අනුව වරදකරු කරනු ලැබූ විට එකී තැනැත්තාට විරුද්ධව මහජන සෞඛ්‍ය පීඩාව සිදු කිරීම සම්බන්ධව අදාළ දඩ මුදල හා එකී පීඩාව ඉවත් කිරීමට නිසි බලධරයා හෝ නිසි බලධරයාගේ බලයලත් නියෝජිතයා විසින් අදාළ නිසි පියවර ගැනීමේ දී වැය වූ මුදලට අමතරව මුළු දඩ මුදලින් 50%ක අතිරේක දඩයකට ද එකී තැනැත්තා යටත් වන්නේ ය ;

(6) 8(2) වැනි උපවගන්තිය යටතේ දඩයක් ලෙස පනවන ලද මුදල, 8(3) උපවගන්තිය යටතේ අතිරේක දඩයක් ලෙස පනවන ලද මුදල හා 9(5) උපවගන්තිය යටතේ අතිරේක දඩයක් ලෙස පනවන ලද මුදල මහෙස්ත්‍රාත්වරයා විසින් පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය ;

(7) ඉහත 9(5) උපවගන්තිය යටතේ යම් පරිශ්‍රයක පවතින මහජන පීඩාවක් ඉවත් කිරීම සඳහා නිසි බලධාරියා හෝ නිසි බලධාරියාගේ බලයලත් නිලධාරියාට වැය වූ මුදල අයකර ගැනීමෙන් පසු එකී මුදල මහෙස්ත්‍රාත්වරයා විසින් නිසි බලධාරියා වෙත බැර කළ යුතු ය.

පළිබෝධ නාශක ඉසීම.

10. (1) නිසි බලධරයා හෝ බලයලත් නිලධරයා විසින් යම් පරිශ්‍රයක අයිතිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු හෝ අදාළ යම් තැනැත්තෙකු වෙත ලිඛිතව යවනු ලබන දැන්වීමක් මගින් එම දැන්වීමේ සඳහන් පළිබෝධ නාශක වර්ගය හෝ ජෛව පාලන ක්‍රම එහි සඳහන් කාලය ඇතුළත දී ජලය එකතුවන සහ

මහජන සෞඛ්‍ය පීඩාවකට තුඩු දෙන බවට සොයාගෙන ඇති යම් පොකුණකට, ජල භාජනයකට, ජලාශයකට හෝ වෙනත් යම් ස්ථානයකට නිසි බලධාරියෙකුගේ උපදෙස් මත ඉසින ලෙසට එම අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) නියමිත කාලය ඇතුළත දී ඉහත (1) වැනි උපවගන්තියේ සඳහන් ලෙසට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවෙකු වන අතර, එවැනි අවස්ථාවක දී එකී තැනැත්තා 8(2) උපවගන්තිය යටතේ සඳහන් දණ්ඩනයකට ද යටත් වන්නේ ය.

*නිසි බලධරයා යනාදීන්ට විරෝධය පෑම හෝ බාධා කිරීම.*

11. (1) නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා මේ ප්‍රඥප්තිය යටතේ ඔහුගේ කාර්යය හෝ කර්තව්‍ය කිරීමට හෝ ඉටු කිරීමට බලය පවරනු ලැබ ඇති යම් තැනැත්තෙකු විසින් එම කාර්යය හෝ කර්තව්‍ය නීත්‍යානුකූල ලෙස කිරීමේ දී ඉටු කිරීමේ දී කිසිම අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් දැන දැනම හෝ හිතාමතාම නිසි බලධරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ එසේ බලය පවරන ලද වෙනත් තැනැත්තෙකුට විරෝධය පෑම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

*ගනු ලබන යම් පියවරක කාර්යක්ෂමතාව අඩු කිරීම.*

12. (1) (අ) යම් පරිශ්‍රයක සිදු කරනු ලබන හෝ පිළිපදිනු ලබන මදුරුවන් බෝවීම වැළැක්වීමට ගනු ලබන පියවර අඩාල කරවීමට ඉඩ ඇති ; හෝ

(ආ) යම් පරිශ්‍රයක සිදු කරනු ලබන හෝ පිළිපදිනු ලබන මහජන පීඩා වැළැක්වීමේ පියවරවල කාර්යක්ෂමතාව අඩු කිරීමට ඉඩ ඇති,

යම් ක්‍රියාවක් අවස්ථාවෝචිත පරිදි එවැනි පියවර පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් දැන දැනම හෝ සිතාමතා නොකළ යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් අයිතිකරුවෙකු, පදිංචිකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(3) ඉහත (2) උපවගන්තියේ දඩ මුදලට අමතරව සිදු කරනු ලැබූ හෝ කාර්යක්ෂමතාවය අඩු කරනු ලැබීමට ගනු ලැබූ ක්‍රියාව නැවත යථාවත් කරන ලෙසට මහෙස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැකිය.

*සම අයිතිකරුවන් හෝ සම පදිංචිකරුවන් වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු බව.*

13. යම් පරිශ්‍රයක එක් තැනැත්තෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් පදිංචිව සිටින විට හෝ යම් දේපළක් එක් තැනැත්තෙකුට වඩා වැඩි පිරිසකට හවුලේ අයිතිව පවතින විට මේ ප්‍රඥප්තියෙන් විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා මේ ප්‍රඥප්තිය මගින් හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම හෝ පැහැර හැරීම වෙනුවෙන් එවැනි එක් එක් පදිංචිකරුවන් සහ එක් එක් අයිතිකරුවන් වෙන් වෙන් වශයෙන් වගකීමට යටත් විය යුතු ය.

*කාණු, ඇලවල් ආදිය නඩත්තු කිරීමට නියමව ඇති ආයතන විසින් ඒවා නඩත්තු කිරීම පැහැර හැරිය විට ඔවුන් වෙත විධාන නිකුත් කළ යුතු බව.*

14. (1) බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හෝ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හෝ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ පහත් බිම් සංවර්ධන මණ්ඩලය විසින් හෝ වෙනත් යම් අධිකාරියක් හෝ ආයතනයක් විසින් යථා පරිදි පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇති යම් කාණුවක්, ඇළක්, දිය පහරක් හෝ වගුරු බිමක්, සුසාන භූමියක්, කසළ බැහැර කරන ස්ථානයක් හෝ වෙනත් භූමියක් එසේ යථා පරිදි පවත්වාගෙන යාම එම ආයතනය විසින් පැහැර හැරීම හෝ අතපසු කිරීම නිසා එම ස්ථානය මදුරුවන් බෝවීමට හිතකර ස්ථානයක් බවට පත් වී ඇතැයි සොයා ගනු ලැබූ අවස්ථාවක,

එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය හෝ උචිත යැයි නිසි බලධරයා විසින් සලකනු ලබන විධාන නිකුත් කිරීමේ බලය ඔහුට ඇත්තේ ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් පළාත් පාලන ආයතනයක් හෝ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය හෝ නාගරික සංවර්ධන අධිකාරිය හෝ පහත් බිම් සංවර්ධන මණ්ඩලය හෝ වෙනත් යම් අධිකාරියක් හෝ ආයතනයක් ඇතොත් මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, එම වරද සඳහා වූ නඩු පැවරීමක් නිසි බලධරයා විසින් එම ආයතනය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා එම ආයතනයට එරෙහිව හෝ එම ආයතන වෙනුවෙන් අදාළ යම් නීතියක් යටතේ පත් කරන ලද වෙනත් යම්කිසි බලධරයෙකුට එරෙහිව ගොනු කරනු ලැබිය යුතු ය.

ඇතුළු වී පරීක්ෂා කිරීමේ බලය.

15. මේ ප්‍රඥප්තිය යටතේ නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා හෝ නිසි බලධරයා විසින් බලය පවරන ලද නිලධරයෙකුට සාධාරණ වේලාවක් තුළ දී යම් පරිශ්‍රයකට ඇතුළු වී -

(1) මෙම ප්‍රඥප්තියේ සඳහන් පීඩාවන් හෝ මහජන සෞඛ්‍යයට හා වෙනත් පීඩාවන් පරීක්ෂා කිරීමට හෝ සෝදිසි කිරීමට බලය ඇත්තේ ය ;

(2) නිසි බලධරයා හෝ බලයලත් නිලධාරියා හෝ නිසි බලධාරියා බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ පදිංචිකරුට හෝ අයිතිකරුට ලිඛිතව දන්වන ලද උපදෙස් අනුව ක්‍රියා කර ඇත්දැයි පරීක්ෂා කිරීමට හෝ සෝදිසි කිරීමට බලය ඇත්තේ ය.

නිසි බලධාරියාගේ බලතල පැවරීම.

16. (1) නිසි බලධරයා විසින් අවශ්‍යයැයි සහ යෝග්‍යයැයි සළකනු ලබන කවර හෝ අවස්ථාවක මේ ප්‍රඥප්තිය මගින් ඔහු වෙත පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයෙකුට බලතල පැවරිය හැකි අතර, එසේ කාර්යය හෝ කර්තව්‍ය පවරනු ලැබූයේ යම් නිලධරයකුට ද, එම නිලධරයා විසින් නිසි බලධරයාගේ පාලනයට සහ අධීක්ෂණයට යටත්ව එම කාර්යය සහ කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

නිසි බලධරයා විසින් විධාන නිකුත් කිරීම.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන සහ ඒවා යටතේ සාදන ලද යම් නියෝගයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් අවශ්‍යයැයි සලකනු ලබන විධාන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයෙකුට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙකුට හෝ පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට හෝ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට හෝ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට හෝ පළාත් පාලන ආයතනයක ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුට කරනු ලැබිය හැකි අතර, එසේ විධාන ලැබූ සෑම නිලධරයෙකු විසින්ම ඒවාට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් එසේ පවරන ලද කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී මේ ප්‍රඥප්තියේ 15 වැනි වගන්තිය යටතේ නිසි බලධරයාට ලබා දී ඇති පරිදිම යම් ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලතල ක්‍රියාත්මක කළ යුතු අතර, එම නිලධරයාට කරන ලද බාධාවක් මේ ප්‍රඥප්තියේ 12 වැනි වගන්තිය යටතේ වරදක් වන්නේ ය.

වැරදි සංඥේය වැරදි විය යුතු බව.

17. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ ප්‍රඥප්තිය යටතේ වූ සෑම වරදක්ම එම පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සංඥේය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

නිසි බලධරයා ආදීන් සාම නිලධරයන් විය යුතු බව.

18. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ සාම නිලධරයන් වෙත පවරා ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිසි බලධරයා හෝ බලයලත් නිලධරයා සහ ඔහුගේ කාර්යය සහ කර්තව්‍ය පවරා ඇති වෙනත් යම් තැනැත්තෙකු විසින් එම කාර්යය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

දැන්වීම් භාර දීම.

19. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන යම් තැනැත්තෙකු වෙයි නම් එම තැනැත්තා වෙත භාරදිය යුතු දැන්වීමක් පෞද්ගලිකව භාරදීම හෝ එම තැනැත්තා පදිංචි එම පරිශ්‍රයේ පදිංචි වෙනත් තැනැත්තෙකු වෙත

හෝ භාර දීම මගින් හෝ පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීම මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්වීම මගින් සිදු කළ හැකිය.

20. මෙම ප්‍රඥප්තිය යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ වරදක් කඩකිරීම සම්බන්ධයෙන් නඩුවක් පැවරීම - නඩු කටයුතු පැවරීම.

(අ) බලයලත් නිලධාරියකු විසින් මිස ; සහ

(ආ) එම වරද අනාවරණය කරගත් දිනයේ සිට මාස 03ක කාල පරිච්ඡේදයක් ඉකුත් වීමෙන් පසුව හෝ නොකළ යුතු ය.

21. බස්නාහිර පළාත් විෂයභාර අමාත්‍යවරයාට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සම්පාදනය කළ හැක්කේ ය :- රීති.

(1) (අ) කිසියම් පරිශ්‍රයක අයිතිකරුවෙකු විසින් හෝ පදිංචිකරුවෙකු විසින් හෝ යම් සතෙකුගේ අයිතිකරුවෙකු විසින් හෝ කවර ස්ථානයක හෝ එක් කොට තැබූ දූවිලි, අළු, රොඩු, කුණු, පෝර, සතුන්ගේ අපද්‍රව්‍ය, මළකුණු ඉවත් කිරීම සම්බන්ධයෙන් හා එබන්දක් යම් තැනැත්තෙකුට පීඩාවක් වන පරිදි වීථියක හෝ වීථියක් අයිනේ එක්තැන් කොට තැබීම වැළැක්වීම සම්බන්ධයෙන් ;

(ආ) සෞඛ්‍යයට අහිතකර විය හැකි පොකුණු, දිය කඩිති, විවෘත අගල්, කාණු, අපවිත්‍ර ජලය හෝ දේවල් ඇති හෝ එකතුවීම සඳහා පාවිච්චි කරන වතුර බස්සවා හැරීම, එබඳු ස්ථාන ශුද්ධ කිරීම, වැසීම හෝ පිරවීම සඳහා ;

(ඇ) කිසියම් පරිශ්‍රයක අයිතිකාරයින් හෝ පදිංචිකාරයින් ද එකී පරිශ්‍රයේ ආරක්ෂාව භාරව සිටින්නවුන් ද විසින් ගෙවල්, ගොඩනැගිලි, ආගමික ස්ථාන, යම් පොදු ස්ථාන හා මිනිසුන් ඒකරාශී වන ස්ථාන ශුද්ධ කිරීම, පිරිසිදු කිරීම, ඒවාට වාතාශ්‍රය ලබා දීම හා ඒවායේ විෂබීජ විනාශ කිරීම සඳහා ;

(ඈ) වසංගත රෝග, ස්ථානීය රෝග හෝ ස්පර්ශයෙන් බෝවන රෝග වැළැක්වීම හෝ මර්දනය කිරීම සඳහා ;

(ඉ) නිසි බලධාරියා විසින් හෝ බලයලත් නිලධාරියා විසින් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියෝගවල කාර්ය සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර හා අධිකරණයේ නඩු පැවරීමේ දී උපයෝගී කරගනු ලබන ආකෘති පත්‍ර ;

(ඊ) මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීම සඳහා යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගත යුතු ක්‍රියාමාර්ග සහ පාවිච්චි කළ යුතු පලිබෝධනාශක වර්ග ;

(උ) මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීම සඳහා මදුරුවන් මගින් බෝවන රෝග මර්දනය පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම ;

(ඌ) මෙම ප්‍රඥප්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කරනු ලබන යම් දඩයකට අදාළව අය කරනු ලබන දඩයෙන් යම් මුදල් ප්‍රමාණයක් එම වරදකරු කිරීමට උත්සුක වූ බලයලත් නිලධාරියාට හෝ නිලධාරීන්ට දිරි දීමනාවක් ලෙස ප්‍රදානය කිරීම ;

(එ) මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වේ.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ සඳහන් පසු දිනයක සිට හෝ ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා බස්නාහිර පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, එම අනනුමැතියේ දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) යම් රීතියක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

22. මෙම ප්‍රඥප්තිය යටතේ නිසි බලධරයා වෙත පවරා තිබූ යම් කාර්යයක් හෝ කර්තව්‍යක් ඉටු කිරීමේ බලය මෙම ප්‍රඥප්තියේ 16 වැනි වගන්තියේ 2 වැනි උපවගන්තිය යටතේ යම් බලයලත් නිලධාරියෙකුට පවරා ඇති විට, අවස්ථාවෝචිත පරිදි, එම බලයලත් නිලධාරියා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, එම බලයලත් නිලධාරියාට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

රාජ්‍ය නිලධාරින් සහය දිය යුතු බව.

23. මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීම සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ කරන කටයුතුවල දී සහාය දීම, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය, ග්‍රාම නිලධාරී, පළාත් පාලන ආයතන ඇතුලු සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම වන්නේ ය.

නිසි බලධරයා.

24. මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා නිසි බලධරයා විය යුතු අතර, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමට ඔහු වගබලාගත යුතු ය.

25. නිසි බලධරයා විසින් මෙම ප්‍රඥප්තියේ කාර්යයන්, කර්තව්‍යයන් හා බලතල ක්‍රියාත්මක කළ යුත්තේ අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධානයන්ට හා අධීක්ෂණයන්ට යටත්ව ය.

බලයලත් නිලධාරීන්.

26. (1) නිසි බලධාරියා විසින් අවශ්‍ය හා යෝග්‍යයැයි සලකනු ලබන කවර අවස්ථාවක වුව ද මෙම ප්‍රඥප්තිය මගින් ඔහු වෙත පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා නිසි බලධරයාගේ පාලනයට හා අධීක්ෂණයට යටත් ව බලයලත් නිලධාරීන් පත් කළ හැකිය.

(2) ඉහත උපවගන්තිය යටතේ බලයලත් නිලධාරීන් වන්නේ බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, බස්නාහිර පළාතේ අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ අනෙකුත් සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විය යුතු ය. මෙම බලයලත් නිලධාරීන් ඔවුන්ගේ රාජකාරී ක්ෂේත්‍රය සඳහා පමණක් මෙම ප්‍රඥප්තිය යටතේ බලයලත් නිලධාරීන් විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

27. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙන් -

"අමාත්‍යවරයා"

යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

"අමාත්‍යාංශ ලේකම්වරයා"

යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වන්නේ ය.

"පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා"

යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරි ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත්කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා"

යන්නෙන් බස්නාහිර පළාතේ දිස්ත්‍රික්කයන් සඳහා පත් කරන ලද, බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු හෝ එම තනතුරක වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත්කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරයා"

යන්නෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරට පත් කරනු ලැබූ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත් කර ඇති යම් නිලධරයෙක් අදහස් කරන අතර, යම් මහ නගර සභාවක පරිපාලන සීමා ඇතුළත සේවය කරන සහ එම නගර සභා සේවයේ යෙදී සිටින ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු, අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක"

යන්නෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට පත් කරනු ලැබූ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට පත් කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක"

යන්නෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට පත් කරනු ලැබූ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත් කර ඇති නිලධාරයෙකු අදහස් වන්නේ ය.

"පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක"

යන්නෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට පත් කරනු ලැබූ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත්කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක"

යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයක ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට පත් කරනු ලැබූ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත් කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා"

යන්නෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට පත් කරනු ලැබ හෝ එම තනතුරේ වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණය කිරීමට හෝ රාජකාරී ඉටු කිරීමට පත් කර ඇති නිලධාරියෙකු අදහස් වන්නේ ය.

"පදිංචිකරු"

යන්නෙන් තමා වෙනුවෙන් හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ නියෝජිතයෙකු වශයෙන් හෝ යම් පරිශ්‍රයක භාරය, කළමනාකාරිත්වය හෝ පාලනය භාරව සිටින හෝ එම පරිශ්‍රයේ පදිංචිව සිටින තැනැත්තෙකු අදහස් වන්නේ ය.

"අයිතිකරු"

යන්නෙන් සම අයිතිකරුවෙකු, බදුකරුවෙකු කවර හෝ අයිතියක් ඇතිව එම පරිශ්‍රයේ කුලියට හෝ නිෂ්පාදන ලබා ගන්නා තැනැත්තෙකු එම පරිශ්‍රයේ නියම නඩත්තුව සඳහා වගකිව යුතු යම් තැනැත්තෙක්, ආයතනයක්, සංස්ථාවක් හෝ නිලධාරියෙක් අදහස් වන්නේ ය.

"භාරකරු"

යන්නෙන් යම් තැනැත්තකුගේ නියෝජිතයෙකු හෝ සේවකයෙකු වශයෙන් යම් පරිශ්‍රයක භාරය, කළමනාකාරීත්වය, පාලනය භාරව සිටින හෝ එම පරිශ්‍රයේ ඇටෝර්නි බලකරුවෙකු හෝ බාල වයස්කාරයෙකු වෙනුවෙන් අධිකරණය විසින් පත් කර ඇති යම් තැනැත්තෙකු අදහස් වන්නේ ය.

"තැනැත්තා"

යන්නෙන් යම් පුද්ගලයෙකු හෝ යම් ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයන් අදහස් වන්නේ ය.

"මහජන පීඩාව"

මනුෂ්‍යයින්ගේ කායික, මානසික, ආර්ථික හා සාමාජීය තත්ත්වයෙන් යහපත් තත්ත්වයන් පවත්වාගෙන යාමට බාධාවන ලෙස මිනිසා විසින්ම සිදු කරනු ලබන ජල දූෂණය, වායු දූෂණය, පස දූෂණය හා අධික ශබ්දය මගින් හෝ වෙනයම් ක්‍රියාවක් මගින් ඇති කරන්නාවූ යම් පීඩාවක් මහජන පීඩාව වන්නේ ය.

"පරිශ්‍රය"

යන්නෙන් යම් ඉඩමක් හා ඒ මත පිහිටි යම් ගොඩනැගිල්ලක් හෝ එම ගොඩනැගිල්ලේ කොටසක් අදහස් වන්නේ ය.

"භාණ්ඩය"

යන්නෙන් යම් තැනැත්තෙකුගේ සෞඛ්‍යට තර්ජනයක් විය හැකි භාවිතයට හෝ පරිභෝජනයට හෝ ගත නොහැකි වීදුරු, ලෝහ, දැව, ප්ලාස්ටික්, ෆයිබර් හෝ රබර් ඇතුළු ඕනෑම දෙයකින් සකස් වී ඇති හෝ යම් දෙයක් අදහස් වන්නේ ය.

07 - 337

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.